**ශ්‍රී ජයවර්ධනපුර මහාරෝගාශාලා මණ්ඩලය - 2016**

---

ශ්‍රී ජයවර්ධනපුර මහාරෝගාශාලා මණ්ඩලයේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිළි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1983 අංක 54 දරන ශ්‍රී ජයවර්ධනපුර මහාරෝගාශාලා මණ්ඩල පනතේ 12 වන වගන්තියේ 3 උපවගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

---

උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000–1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ.

## 1.4 මතය ව්‍යාචනය සඳහා පදනම

---

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවල ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ, මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ හා හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනයේ සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ වාර්තාගත වූ හෝ වාර්තාගත නොවූ හෝ විෂයයන් සහ මූලිකාංග වලට අදාළව කවර හෝ ගැලපීම් කිරීමේ අවශ්‍යතාවයක් තිබුණේ දැයි තීරණය කිරීමට මට නොහැකිවිය.

## 2. මූල්‍ය ප්‍රකාශන

---

## 2.1 මතය ව්‍යාචනය

---

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මට නොහැකි විය. ඒ හේතුකොට ගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 7

ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු.1,760,458,764 ක් වූ ස්ථාවර වත්කම් සම්පූර්ණයෙන් ක්ෂයකර ඇතත් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 3 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 9

2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු වටිනාකම රු.270,037,438 ක් වූ ඉතිරි තොග අගය කිරීම සඳහා යොදාගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

**2.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව පශ්චාත් සේවක ප්‍රතිලාභ වෙන්කිරීම් ලෙස රු.449,499,047 ක් දක්වා තිබුණ ද එම වෙන්කිරීම් සම්බන්ධයෙන් ගිණුම්කරණ ප්‍රතිපත්තියක් හඳුනාගෙන නොතිබුණි.

**2.2.3 ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය තුළදී අපහරණ මණ්ඩලය විසින් ඇස්තමේන්තුකර තිබුණු පිරිවැය රු.23,999,790 ක්වූ, සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද වෛද්‍ය හා ශල්‍ය උපකරණ මෙන්ම ගොඩනැගිලි ද්‍රව්‍ය සහ ලී බඩු උපකරණ ඒකක 3,892 ක සත්‍ය පිරිවැය හා සමුච්චිත ක්ෂය හඳුනාගෙන ගිණුම්වලින් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) පශ්චාත් සේවක ප්‍රතිලාභ වෙනුවෙන් සේවා කාලය අනුව මූලික වැටුපට ජීවන වියදම් දීමනාව එකතුකොට එම වටිනාකමින් භාගයක් වෙන්කිරීම දැනට අනුගමනය කරනු ලබන ක්‍රමය වන අතර ඒ පිළිබඳ පරීක්ෂාවේදී නිරීක්ෂණය වූ අඩුපාඩු පහත දැක්වේ.

(i) සමාලෝචිත වර්ෂයට පෙර වර්ෂවලදී විශ්‍රාම ගොස් සිටි සේවකයින් තිදෙනෙකු වෙනුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා රු.1,004,992 ක් පාරිතෝෂික ප්‍රතිපාදන සලසා තිබුණි.

(ii) සේවකයෙකු වෙත සමාලෝචිත වර්ෂය තුළදී ගෙවා තිබුණු පාරිතෝෂික වටිනාකම රු.168,121 ක් ගෙවිය යුතු පාරිතෝෂික ගිණුම හර කරනු වෙනුවට පාරිතෝෂික ප්‍රතිපාදන ගිණුමට හර කර තිබුණි.

(iii) පාරිතෝෂික ප්‍රතිපාදන සලසා නොතිබුණු සේවකයින් දෙදෙනෙකු සමාලෝචිත වර්ෂය තුළදී විශ්‍රාම ගොස් තිබුණු අතර ඔවුන් වෙත ගෙවා තිබුණු පාරිතෝෂික රු.691,645ක් ඉකුත් වර්ෂයේ ලාභයට ගැලපීම වෙනුවට පාරිතෝෂික ප්‍රතිපාදන ගිණුමට හර කර තිබුණි.

(iv) ඉකුත් වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට පාරිතෝෂික වෙන්කිරීම් සලසා නොතිබුණු වෙනත් සේවකයින් 30 දෙනෙකු වෙනුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයේදී රු.6,062,715 ක පාරිතෝෂික ප්‍රතිපාදන සලසා තිබුණි. එසේ වුවද ඉන් ඉකුත් වර්ෂවලට අදාළ රු.5,276,554 ක් ඉකුත් වර්ෂයේ ලාභයට ගැලපීම වෙනුවට සමාලෝචිත වර්ෂයේ ලාභයට ගලපා තිබුණි.

(v) සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් සේවයේ යෙදී සිටි සේවකයින් දෙදෙනෙකු වෙනුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා රු.808,897 ක පාරිතෝෂික ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(vi) සේවකයින් 84 දෙනෙකු වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ පාරිතෝෂික ප්‍රතිපාදන රු.1,845,812 ක් වැඩියෙන් ගණනය කර ගිණුම්ගත කර තිබුණි.

(vii) සේවකයින් 03 දෙනෙකුගේ පාරිතෝෂිකයෙන් ආපදා ණය ශේෂය රු.395,867ක් හා උත්සව අත්තිකාරම් රු.21,750 ක් අඩුකර මුදල් ගෙවා තිබුණද අඩුකර ගත් ණය හා අත්තිකාරම් ගිණුම් ගත කර නොතිබුණි.

(viii) සේවකයින් දෙදෙනෙකු වෙත ගෙවිය යුතුව තිබුණු රු.334,557 ක පාරිතෝෂික මුදල ඉකුත් වර්ෂයේදී ගෙවීමේදී ගෙවිය යුතු පාරිතෝෂික ගිණුමට හර කිරීමට වෙනුවට පාරිතෝෂික ප්‍රතිපාදන ගිණුමට හර කර තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු පාරිතෝෂික ගිණුම හා ප්‍රතිපාදන ගිණුම පිළිවෙලින් වැඩියෙන් හා අඩුවෙන් දක්වා තිබුණි.

(ix) සමාලෝචිත වර්ෂයේදී සේවයෙන් ඉවත්වූ සේවකයෙකුට ගෙවන ලද විශ්‍රාම පාරිතෝෂික රු.525,490 ක් ආපදා ණය ගිණුමට හර කර තිබීම හේතුවෙන් ආපදා ණය ගිණුම හා පාරිතෝෂික වෙන් කිරීමේ ගිණුම එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය තුළදී නේවාසික රෝගී කාමර ගාස්තු මත අයකර, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ගෙවා තිබුණු එකතු කළ අගය මත බදු රු.3,115,280 ක් නේවාසික රෝගී කාමර ගාස්තු ආදායම් ගිණුමට හර නොකර අයවිය යුතු එකතු කළ අගය මත බදු ගිණුමකට හර කර තිබුණි.

(ඈ) ප්‍රාග්ධන ප්‍රදානවලින් මිලදී ගෙන තිබූ වත්කම් සඳහා ඉකුත් වර්ෂයේදී දේපල, පිරියත හා උපකරණ ක්ෂය රු.18,095,030 කින් අඩුවෙන් ගිණුම්ගත කර තිබීමේ වරද සමාලෝචිත වර්ෂයේදී නිවැරදි කර තිබුණු නමුත්, ඊට සමාන අගයකින් වත්කම් ක්‍රමක්ෂය කර නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේදී ගොඩනැගිලි හා ලී බඩු උපකරණ ක්ෂය රු.93,756 ක් අඩුවෙන් ගිණුම් ගත කර තිබුණි.

(ඊ) වෘත්තීය ගාස්තු මත අයකළ යුතු එකතු කළ අගය මත බදු වටිනාකම හඳුනාගෙන අයකර නොතිබුණු අතර ඒ වෙනුවට ලැබිය යුතු එකතු කළ අගය මත බදු ගිණුමට හා ගෙවිය යුතු බදු ගිණුමකට ඇස්තමේන්තු කරන ලද රු.8,500,000 ක වටිනාකමක් පිළිවෙලින් හර හා බැරකර තිබුණි.

(උ) මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) දේපල, පිරියත හා උපකරණ ක්ෂය රු.243,786,065 ක් වර්ෂයේ ලාභයට ගැලපිය යුතු වුවද එය රු.257,076,160 ක් ලෙස ගලපා තිබුණි.

(ii) ඉකුත් වර්ෂයට අදාළ ගැලපුම් ලෙස රු.15,104,017 ක් වර්ෂයේ ලාභයට සාවද්‍ය ලෙස ගලපා තිබුණි.

(iii) දේපල, පිරියත හා උපකරණ මිලදී ගැනීම් සඳහා සමාලෝචිත වර්ෂය තුළදී වැය කර තිබුණු මුළු මුදල රු.535,040,707 ක් වුවද, ඉන් වර්ෂය තුළ අපහරණය කර තිබුණු මෝටර් රථ 04 ක පිරිවැය රු.5,166,900 ක් අඩුකර ඉතිරි රු.529,873,807 ක් පමණක් මුදල් ගලායාම් ලෙස දක්වා තිබුණි. තවද එම මෝටර් රථ 04 විකිණීමෙන් ලද රු.5,267,060 ක් මුදල් ගලා ඒමක් ලෙස දක්වා නොතිබුණි.

(ඌ) සමාලෝචිත වර්ෂය තුළදී දේපල පිරියත හා උපකරණ මිලදී ගැනීම සඳහා වැයකර තිබුණු රු.5,497,570 ක් දේපළ පිරියත හා උපකරණ යටතේ ප්‍රාග්ධනිත කළයුතු වුවද පුනරාවර්තන වියදම් ලෙස සලකා ගිණුම්ගත කර තිබුණි.

(එ) ඉකුත් වර්ෂවලදී හා සමාලෝචිත වර්ෂයේදී පරිත්‍යාග ලෙස ලැබී තිබුණු උපකරණ ඒකක 389 ක වටිනාකම ගණනය කර ගිණුම්ගතකර නොතිබුණි.

(ඒ) සමාලෝචිත වර්ෂය තුළදී මිලදීගෙන තිබුණු රු.25,359,934 ක් වටිනා Incinerator යන්ත්‍රයේ පිරිවැය විදුලි උපකරණ (Electrical Equipment) ගිණුමට හර කිරීම වෙනුවට වෙනත් ගොඩනැගිලි (Other Buildings) ගිණුමට හර කර තිබුණි.

### 2.2.4 පැහැදිලි නොකළ වෙනස්කම්

-----------------------------------

පහත සඳහන් විෂයයන්වලට අදාළව මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම හා විගණනයට ඉදිරිපත් කළ ලිපිගොනු හා ලේඛන අනුව වටිනාකම අතර එකතුව රු.778,874,210 ක වෙනසක් පැවති නමුත් වෙනසට හේතු පැහැදිලි නොකෙරුණි.

| | ගිණුම් විෂයය | විගණනයට ඉදිරිපත් කළ ලිපිගොනුව/ලේඛනය | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම | ලිපිගොනුව/ලේඛනය අනුව වටිනාකම | වෙනස |
|---|---|---|---|---|---|
| | | | රු. | රු. | රු. |
| (අ) | 2016 දෙසැම්බර් 31 දිනට තොගය | පරිගණක පද්ධතිය තුළ පවතින තොග ලෙජරය | 243,908,511 | 945,610,170 | 701,701,659 |
| (ආ) | රෝහල් ගාස්තු ආදායම | 2016 දෙසැම්බර් 31 දිනට පරිගණක පද්ධතිය තුළ පැවති රෝහල් ගාස්තු ආදායම් වර්ගීකරණය | 1,782,161,942 | 1,716,661,796 | 65,500,146 |
| (ඇ) | 2016 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු ආපදා ණය | පරිගණක පද්ධතිය තුළ පැවති විස්තරාත්මක ආපදා ණය වාර්තාව | 154,018,179 | 145,639,273 | 8,378,906 |
| (ඈ) | 2016 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු රෝහල් ගාස්තු | රෝහල් ගාස්තු ණයගැති පාලන ගිණුම | 101,254,073 | 101,242,256 | 11,817 |
| (ඉ) | 2016 දෙසැම්බර් 31 දිනට ණයහිමියෝ | මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කළ උපලේඛනය | 199,061,610 | 202,343,292 | 3,281,682 |
| | | | | | 778,874,210 |

**2.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම්**

පහත සඳහන් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකිරීම හේතුවෙන් ඒවා සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට හෝ සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

| | විෂයය | වටිනාකම | ඉදිරිපත් නොවූ සාක්ෂි |
|---|---|---|---|
| | | රු. | |
| (අ) | පරිගණක පද්ධතිය අනුව රෝහලේ අංශ 5 ක වර්ෂය අවසානයට ඉතිරි තොගය | (1,137,150,035) | පරිගණක පද්ධතිය අනුව තොගයේ සෘණ අගයක් ඇතිවූ ආකාරය හා පරිගණක පද්ධතියේ තොරතුරුවල නිවැරදිතාවය තහවුරු කරගත හැකි ලිඛිත සාක්ෂි. |
| (ආ) | ණයහිමියෝ<br>රෝහල් ගාස්තු ණයගැතියෝ | (22,139,133)<br>(29,157,006) | ණයහිමි හා ණයගැති ශේෂ සෘණ අගයක් වූ ආකාරය හා පරිගණක පද්ධතියේ තොරතුරුවල නිවැරදිතාව තහවුරු කරගත හැකි ලිඛිත සාක්ෂි. |
| (ඇ) | ශල්‍ය ද්‍රව්‍ය | 199,116,129 | පරිගණක පද්ධතිය තුළ වෛද්‍ය උපකරණ මිලදී ගැනීමේ ගිණුමෙන් ශල්‍ය ද්‍රව්‍ය මිලදී ගැනීමේ ගිණුමට මාරු කරන ලද ද්‍රව්‍ය වර්ගය හඳුනා ගැනීමට ලිඛිත සාක්ෂි. |
| (ඈ) | අතථ්‍ය තොග (Virtual Stock) | - | තොගය තුළ ඇතුළත් කර තිබුණු අතථ්‍ය තොග වර්ගය, ප්‍රමාණය හා වටිනාකම හඳුනාගත හැකි ලිඛිත සාක්ෂි. |

**2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා යුද හමුදාවෙන් සහ ශ්‍රී ලංකා නාවික හමුදාවෙන් වර්ෂ 07 ක කාලයක සිට ලැබිය යුතුව පැවති රෝහල් ගාස්තු රු.4,137,333 ක් අයකර ගැනීමට ප්‍රමාණවත් පියවර ගෙන නොතිබුණි.

(ආ) 2016 දෙසැම්බර් 31 දිනට පැවති වර්ෂ 06 කට වඩා පැරණි ගෙවිය යුතු වෘත්තීය ගාස්තු රු.3,616,142 ක් නිරවුල් කිරීමට හෝ ආදායම් ලෙස හඳුනාගෙන ගිණුම්ගත කිරීමට හෝ කටයුතු කර නොතිබුණි.

**2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්.**

--------------------------------------------------------------------------

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| **නීති රීති, රෙගුලාසි වලට යොමුව** | **අනුකූල නොවීම්** |
|---|---|
| (අ)2006 අංක 10 දරන දේශීය ආදායම් බදු පනත | ගෙවන වාට්ටුවල රෝගීන්ට සිදුකරනු ලබන ශල්‍යකර්ම හා ප්‍රතිකාර සඳහා රෝගීන්ගෙන් අයකරනු ලබන වෘත්තීය ගාස්තු මත උපයන විට ගෙවීම් බදු අයකර දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ප්‍රේෂණය කළ යුතු නමුත්, 2016 ජනවාරි සිට 2017 අප්‍රේල් දක්වා කාලයට අදාළව ඇස්තමේන්තුගත වටිනාකම රු.45,954,202 ක් වූ උපයන විට ගෙවීම් බදු අයකර නොතිබුණි. |
| (ආ) **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | |
| (i) මුදල් රෙගුලාසි 756 (2) (ආ) | සමීක්ෂණය කරනු ලබන භාණ්ඩ පිළිබඳ දැනුමක් සහිත නිලධාරියෙකු සමීක්ෂණ මණ්ඩලයට පත්කළ යුතු නමුත් 2015 හා 2016 වර්ෂවලදී ශල්‍යාගාර උපකරණ හා වෛද්‍ය උපකරණ සමීක්ෂණය සඳහා පත්කර තිබුණු සමීක්ෂණ මණ්ඩලවලට එම උපකරණ පිළිබඳ දැනුමැති නිලධාරියෙකු පත්කර නොතිබුණි. තවද රෝහල් ගොඩනැගිලිවල සවිකර තිබුණු ක්‍රියාකාරී තත්ත්වයේ පැවති විදුලි සෝපාන 5 ක් දෝෂ සහගත බවට, තවදුරටත් පාවිච්චි කළ නොහැකි බවට හෝ පාවිච්චි කිරීම අවදානම් සහිත බවට කාර්මික තාක්ෂණ නිලධාරීවරයෙකුගෙන් සමන්විත සමීක්ෂණ මණ්ඩලයක නිර්දේශයකින් තොරව හා වටිනාකම තක්සේරු කිරීමකින් තොරව ගලවා ඉවත් කර රු.737,220 කට විකුණා තිබුණි. |

| | |
|---|---|
| (ii) මුදල් රෙගුලාසි 757 (2) | භෞතික තොග සත්‍යාපනයකදී හඳුනාගන්නා ලද තොග ඌනතා, අතිරික්තතා, නොසැසඳීම් හා නැතිවීම් සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන්ගෙන් කරුණු පැහැදිලි කරවා ගැනීමට කටයුතු කළ යුතු අතර ඒ පිළිබඳ ගණන්දීමේ නිලධාරී විසින් ඉදිරි ක්‍රියාමාර්ග ගත යුතුවේ. එසේ වුවත්, පරිගණක පද්ධතිය තුළ වූ තොග ලෙජරවලට අතථ්‍ය තොග (Virtual Stock) ඇතුළත් කර තිබුණු බැවින් 2016 දෙසැම්බර් 31 දිනට තොග ඌනතා, අතිරික්තතා, නොසැසඳීම් හා නැතිවීම් හඳුනාගත නොහැකි වී තිබුණි. |
| (iii) මුදල් රෙගුලාසි 770(3) | ගත් මිල රු.3,000 කට නොඅඩු වූ යම් භාණ්ඩයක් විනාශ කිරීමට සමීක්ෂණ මණ්ඩලය විසින් නිර්දේශ කර ඇති ඕනෑම අවස්ථාවක ඒ සම්බන්ධයෙන් ප්‍රවීණතාවයක් ඇති ස්වාධීන නිලධාරියෙකුගේ අදහස් ලබාගත යුතු වුවද, එසේ අදහස් ලබාගැනීමකින් තොරව සමාලෝචිත වර්ෂය තුළදී ශල්‍ය උපකරණ, වෛද්‍ය උපකරණ, රසායනාගාර උපකරණ, ගොඩනැගිලි ද්‍රව්‍ය හා ලී බඩු උපකරණ අපහරණය කර තිබුණි. |
| (ඇ) 2007 මාර්තු 09 දිනැති අංක 133 දරන අයවැය චක්‍රලේඛය හා 2008 දෙසැම්බර් 31 දිනැති අංක 30/2008 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව, සේවකයෙකුට ලබාදිය හැකි උපරිම ආපදා ණය මුදල රු.250,000 ක් වුවද, සමාලෝචිත වර්ෂයේදී සේවකයින් 135 දෙනෙකු වෙත එම සීමාව ඉක්මවා රු.259,660 සිට රු.384,639 දක්වා වූ පරාසයක ගෙවා තිබුණු ණයවල එකතුව රු.7,155,924 ක් විය. එසේම 2017 සැප්තැම්බර් 30 දිනෙන් අවසන් වන මාස 09 තුළදී තවත් සේවකයින් 105 දෙනෙකු වෙත රු.258,114 සිට රු.399,346 දක්වා වූ පරාසයක ගෙවා තිබුණු උපරිම ණය හිමිකම ඉක්ම වූ වටිනාකම රු.6,758,503ක් විය. |
| (ඈ) 2009 මැයි 26 දිනැති අංක 39 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛය, 2015 ජුනි 26 දිනැති අංක 18/2015 හා 2015 ජුලි 13 දිනැති අංක 18/2015(i) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ | රාජ්‍ය සේවයේ විධායක සේවා ගණයේ නිලධාරීන්ට විශේෂ දීමනාවක් ලබා දී තිබුණු නමුත්, එම දීමනා සංස්ථාවකට අදාළ කරගැනීම සඳහා වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය හා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගත යුතු වේ. නමුත් එම නිර්දේශය හෝ අනුමැතිය ලබා ගැනීමකින් තොරව එම විශේෂ දීමනාව රෝහලේ ස්ථිර තනතුරු දරන නිලධාරීන් 8 දෙනෙකු වෙත ගෙවා තිබුණි. 2015 ජුලි 01 දින සිට 2016 දෙසැම්බර් 31 දින දක්වා කාලය තුළදී එසේ ගෙවා තිබුණු මුළු දීමනා මුදල රු.616,500ක් විය. |
| (ඉ) 2015 ජුලි 10 දිනැති අංක 02/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | සමාලෝචිත වර්ෂය තුළදී රෝහල සතුව තිබුණු පොත් අගය රු.5,166,900 ක් වූ වාහන 04 ක් රු.5,267,060 කට විකුණා තිබුණු නමුත්, එම වාහන 04 අපහරණය සඳහා සුදුසු බවට යාන්ත්‍රික ඉංජිනේරුවරයෙකු / කාර්මික නිලධාරීවරයෙකු ඇතුළු නිලධාරීන් 03 දෙනෙකුගෙන් යුත් විශේෂ සමීක්ෂණ මණ්ඩලයක් විසින් හඳුනාගෙන නොතිබුණි. තවද චක්‍රලේඛයේ 05 ඡේදය ප්‍රකාරව මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ මෝටර් රථ පරීක්ෂකවරයෙකු හා |

කාර්මික/තාක්ෂණික නිලධාරීවරයෙකුගෙන් සමන්විත කමිටුවක් මගින් එම වාහනවල අවම විකුණුම් මිල තීරණය කර නොතිබුණි. කෙසේ වුවද මෙම වාහන 04 ලංසු කැඳවා විකුණා තිබුණු අතර විකිණීමෙන් ලද මුදල් චක්‍රලේඛයේ 10 ඡේදය ප්‍රකාරව ඒකාබද්ධ අරමුදලට බැරකර නොතිබුණි. තවද වාහන විකිණීම පිළිබඳ විස්තර විගණකාධිපති වෙත දැනුම් දී නොතිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා රෝහල් මණ්ඩලයේ ඌනතාවය රු.175,818,974 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.352,618,183 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.176,799,209 කින් වර්ධනය වී තිබුණි. සමාලෝචිත වර්ෂයේ රෝහලේ මෙහෙයුම් වියදම් රු.636,319,584 කින් වැඩි වී තිබුණු නමුත් වර්ෂයේ ආදායමද රු.818,636,117 කින් වැඩිවී තිබීම ඉහත වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 4 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2012 වර්ෂයෙහි මූල්‍ය ඌනතාවයක් ද 2013 හා 2014 වර්ෂවල මූල්‍ය අතිරික්තයක් ද ඇති වී තිබුණු අතර නැවත 2015 හා 2016 වර්ෂවලදී මූල්‍ය ඌනතාවයක් ද ඇති වී තිබුණි. කෙසේ වුවද මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික, රාජ්‍ය බදු හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂය නැවත ගැලපීමේදී මණ්ඩලයේ දායකත්වය 2012 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා රු.716,896,615 සිට රු.1,739,662,005 දක්වා අඛණ්ඩව වර්ධනය වී තිබුණද 2015 වර්ෂයේදී රු.950,142,035 ක් දක්වා අඩු වී තිබුණි. එහෙත්, සමාලෝචිත වර්ෂයේදී නැවතත් රු.1,305,091,352 ක් දක්වා වර්ධනය වී තිබුණු අතර එය ඉකුත් වර්ෂයට සාපේක්ෂව රු.354,949,317 කින් වැඩිවී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්ය සාධනය

උසස් ආචාර ධර්මයන්ගෙන් හා ප්‍රමිතීන්ගෙන් යුත් ගුණාත්මක හා ආරක්ෂාකාරී රෝගී සත්කාර සේවාවක් සැපයීම රෝහලේ මෙහෙවර වන අතර එය ඉටුකර ගැනීම සඳහා පිළියෙල කර තිබුණු 2016 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම, ප්‍රසම්පාදන සැලැස්ම සහ ප්‍රගති වාර්තා අනුව කාර්ය සාධනය පිළිබඳ නිරීක්ෂණ පහතින් දැක්වේ.

(අ) 2016 වර්ෂය වෙනුවෙන් පිළියෙල කර තිබුණු සාරාංශගත කාර්ය සාධන දත්ත (Bulletin) අනුව, ඉකුත් වර්ෂය හා සැසඳීමේදී රෝහලේ සමස්ත ඇඳන් උපයෝජනය සියයට 63.4 සිට සියයට 68.8 දක්වා වර්ධනය වී තිබුණද පවතින වාට්ටු 24 න් වාට්ටු 8 ක ඇඳන් උපයෝජනය සියයට 48.5 සිට සියයට 4.8 දක්වා පරාසයකින් අඩුවී තිබුණි.

(ආ) ඉකුත් වර්ෂයට සාපේක්ෂව Physiotheraphy Service, Pathological Services, Endoscopy Test සහ E.C.G. Test සඳහා යොමු වූ රෝගීන් සංඛ්‍යාව පිළිවෙලින් සියයට 141 කින්, සියයට 19 කින්, සියයට 11 කින් හා සියයට 17 කින් ඉහළ ගොස් තිබුණු අතර එය යහපත් ප්‍රවනතාවයක් විය.

(ඇ) රෝහල සඳහා මූල්‍ය හා පරිපාලන ගොඩනැගිල්ලක් ඉදිකිරීමේ කාර්යය වෙනුවෙන් 2014 වර්ෂයේ සිට ඇස්තමේන්තු පිළියෙල කර ක්‍රියාකාරී සැලැස්මට හා ප්‍රසම්පාදන සැලැස්මට ඇතුළත් කර තිබුණු අතර 2016 වර්ෂයේදී ඒ සඳහා රු.මිලියන 100 ක ප්‍රතිපාදන සලසා ගෙන තිබුණි. මෙම ඉදිකිරීම සමාලෝචිත වර්ෂය තුළදී නිම කිරීමට අපේක්ෂිතව තිබුණද 2017 ඔක්තෝබර් 31 දින වන විටත් ආරම්භ කර නොතිබුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පරිත්‍යාග වශයෙන් රෝහල වෙත ලැබෙන වෛද්‍ය උපකරණ, කාර්යාල උපකරණ, ඖෂධ හා වෙනත් ද්‍රව්‍ය ලේඛනගත කිරීමේ විධිමත් ක්‍රමවේදයක් 2016 දෙසැම්බර් 31 දින වන විටත් ක්‍රියාත්මක කර නොතිබුණි. රෝහලේ විවිධ අංශ 28 ක් වෙත ඉකුත් වර්ෂවලදී හා සමාලෝචිත වර්ෂය තුළදී පරිත්‍යාග වශයෙන් ලැබී තිබුණු එවැනි උපකරණ ඒකක 389 ක වටිනාකම් ගණනය කර ස්ථාවර වත්කම් ලේඛනයට, ඉන්වෙන්ට්‍රි ලේඛනයට හා තොග ලේඛනවලට අදාළ පරිදි ඇතුළත් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සෞඛ්‍ය අධ්‍යයන විශ්ව විද්‍යාල විද්‍යායතනය පිහිටුවීම සඳහා ශ්‍රී ජයවර්ධනපුර රෝහල සහ තරුණ කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය අතර එළඹ තිබුණු අවබෝධතා ගිවිසුමේ කාලය 2016 මැයි 09 දින අවසන් වූ පසු තරුණ කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය එම වගකීමෙන් ඉවත් වී තිබුණි. එම ආයතනයේ අධ්‍යාපනය ලබමින් සිටි පළමු කණ්ඩායම් දෙකෙහි පාඨමාලා සම්පූර්ණ වනතුරු තවදුරටත් එය පවත්වා ගෙන යාමටත්, ශ්‍රී ජයවර්ධනපුර රෝහල එහි පරිපාලන හා මූල්‍ය කටයුතු සිදුකිරීමටත් සහ රෝහල මගින් දරනු ලබන සියළු වියදම් මාසිකව සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් ප්‍රතිපූරණය කිරීමත් යන පදනම මත සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යවරයාගේ උපදෙස් පරිදි එය ඉදිරියටත් පවත්වාගෙන ගොස් තිබුණි. එසේ වුවද, එම ආයතනය වෙනුවෙන් 2016 දෙසැම්බර් 31 දක්වා රෝහල විසින් වැය කර තිබුණු රු.3,808,586 ක මුදල 2017 අගෝස්තු වන විටත් සෞඛ්‍ය අමාත්‍යාංශය වෙතින් ප්‍රතිපූරණය කරගෙන නොතිබුණි.

(ඇ) එක් එක් අංශ අතර රෝහල් කාර්ය මණ්ඩලය අභ්‍යන්තරව ස්ථාන මාරුකිරීමේ නිශ්චිත ප්‍රතිපත්තියක් හෝ ක්‍රමවේදයක් හඳුනාගෙන ක්‍රියාත්මක කිරීමට 2017 ඔක්තෝබර් 31 දින වන විටත් කටයුතු කර නොතිබුණි. රෝහලේ පරිපාලන අංශය විසින් විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණු තොරතුරු අනුව, වර්ෂ 10 කට වැඩි කාලයක් එකම අංශයක හෝ සේවා ස්ථානයක සේවය කරන කාර්ය මණ්ඩලය පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ.

| **සේවා කාණ්ඩය** | **සංඛ්‍යාව** |
|---|---|
| හෙද නිලධාරීන් | 71 |
| ඕඩර්ලි සේවකයින් | 115 |
| කළමනාකරණ සහකාර | 25 |

එකම ක්ෂේත්‍රයක් හෝ කාර්යයක් පිළිබඳ පමණක් ලබාගන්නා නිපුණතාවය නිසා නිලධාරීන් හා සේවකයින් වෙනත් අංශයක සේවයෙහි යොදවා ගත නොහැකි වීම, තනතුර අනුව එක් එක් අංශයන්හි කාර්යයන් සම්බන්ධයෙන් සියළු නිලධාරීන් හා සේවකයන් විසින් ලබාගත යුතු දැනුම ලබාගත නොහැකි වීම, කාර්ය මණ්ඩල පරිපාලනය අපහසුවීම හා සමස්ත අභ්‍යන්තර පාලන පද්ධතිය දුර්වලවීම කෙරෙහි මෙම තත්ත්වය බලපෑ හැකි බව නිරීක්ෂණය විය.

(ඇ) හෘද සැත්කම් සඳහා රජයේ රෝහල්වලින් ශ්‍රී ජයවර්ධනපුර රෝහලට යොමු කරන රෝගීන්ගේ බිල්පත්, ශ්‍රී ජයවර්ධනපුර රෝහල විසින් වෛද්‍ය සැපයීම් අංශයෙන් ලබාගන්නා ඖෂධ බිල්පත්වලට හිළව් කිරීම සිදුකර තිබුණි. මේ පිළිබඳව සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය සමග 2009 වර්ෂයේ සිට සිදුකර තිබුණු සාකච්ඡාවලදී, රජයේ රෝහල්වලින් හෘද සැත්කම් සඳහා මෙම රෝහලට රෝගීන් යොමු කිරීමේ ක්‍රමවේදය, ඒ සඳහා සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශ අනුමැතිය තහවුරු කරගැනීමේ ක්‍රමවේදය හා බිල්පත් පියවීමේ හා හිළව් කිරීමේ ක්‍රමවේදය ඇතුළත්ව දෙපාර්ශවය අතර අවබෝධතා ගිවිසුමක් පිළියෙල කිරීමට තීරණය කර තිබුණද 2017 ඔක්තෝබර් 31 දින වන විටත් එවැනි ගිවිසුමකට එළඹී නොතිබුණි. මේ අනුව නිසි ක්‍රමවේදයකින් තොරවම රෝගීන් මෙම රෝහලට යොමුකර සැත්කම් සිදුකර තිබුණු අතර, සැත්කම් වියදමට අමතරව පරීක්ෂණ ගාස්තුද රෝහල් බිල්පත්වල ඇතුළත්ව තිබුණි. එසේම එම රෝගීන් රෝහල් ගත වී සිටින දින ගණන වැඩිවීමෙන් බිල්පත් වටිනාකම ඉහළ ගොස් තිබුණි. නමුත් එවැනි අමතර වියදම් හිළව් කිරීමට වෛද්‍ය සැපයීම් අංශයේ එකඟතාවය ලැබී නොතිබුණු අතර 2015 දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව තිබුණු රෝහල් ගාස්තු රු.260,636,619 ක් සමාලෝචිත වර්ෂයේදී වෛද්‍ය සැපයීම් අංශයට ගෙවිය යුතු වටිනාකමෙන් හිළව් කිරීමට රෝහල විසින් ඒකපාර්ශවිකව කටයුතු කිරීම හේතුවෙන් වෛද්‍ය සැපයුම් අංශය විසින් එම හිළව් කිරීම සිදුකර නොතිබුණි.

(ඉ) ගෙවන වාට්ටුවල රෝගීන්ට සිදුකරනු ලබන ශල්‍යකර්ම හා ප්‍රතිකාර සඳහා රෝගීන්ගෙන් වෘත්තීය ගාස්තු අයකර එම ගාස්තුවෙන් සියයට 99.85 ක් ශල්‍යකර්මය සඳහා සහභාගී වූ විශේෂඥ වෛද්‍ය නිලධාරීන්, වෛද්‍ය නිලධාරීන් හා සහාය කාර්ය මණ්ඩලයට ගෙවා තිබුණි. 2016 වර්ෂය තුළදී පමණක් එසේ ගෙවා තිබුණු මුළු වෘත්තීය ගාස්තුව රු.309,427,740 ක් විය. මේ සම්බන්ධයෙන් නිරීක්ෂණය වූ කරුණු පහතින් දැක්වේ.

(i) සාමාන්‍ය රාජකාරී වේලාවෙන් බැහැරව විශේෂඥ වෛද්‍යවරුන්ට පෞද්ගලික සේවයේ යෙදීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබුණු නමුත්, අයකළ හැකි වෘත්තීය ගාස්තු වටිනාකම හෝ එය ගණනය කරනු ලබන ආකාරය පිළිබඳව නිශ්චිත ක්‍රමවේදයක් කළමනාකරණය විසින් පිළියෙලකර නොතිබුණු අතර අදාළ විශේෂඥ වෛද්‍යවරයා විසින් තම පෞද්ගලික අභිමතය පරිදි අයකරනු ලබන වෘත්තීය ගාස්තු ප්‍රමාණය තීරණය කර තිබුණි.

(ii) විශේෂඥ වෛද්‍යවරු හැර ශල්‍යකර්ම සඳහා සහභාගී වන අනෙකුත් වෛද්‍යවරු, හෙද නිලධාරීන් හා සහාය කාර්ය මණ්ඩලය වෙත වෘත්තීය ගාස්තු ගෙවිය හැකි බවට හෝ අයකල හැකි බවට කිසිදු අධිකාරී බලයක් හෝ අනුමැතියක් නොතිබියදී 2016 වර්ෂයේ ජනවාරි 01 සිට 2017 අප්‍රේල් දක්වා කාලයට අදාළව වෘත්තීය ගාස්තු ලෙස ඔවුන් වෙත ගෙවා තිබුණු මුළු මුදල රු.77,925,691ක් විය.

**4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්**

**-------------------------**

2016 ජනවාරි 01 දින සිට 2016 සැප්තැම්බර් 30 දින දක්වා කාලපරිච්ඡේදය තුළදී, ශල්‍යාගාර 8 ක් වෙත ශල්‍යාගාර උප ගබඩාවෙන් නිකුත්කර තිබුණු මුළු පිරිවැය රු.5,707,922 ක් වූ ඖෂධ හා ශල්‍ය ද්‍රව්‍ය රෝහල් ගාස්තුවලට එකතුකර රෝගීන්ගෙන් අයකර ගෙන නොතිබුණි. එසේම ශල්‍යාගාරය වෙත නිකුත් නොකළ ශල්‍ය ද්‍රව්‍ය ඒකක 609 ක මුළු පිරිවැය රු.238,304 ක් රෝගීන්ගෙන් රෝහල් ගාස්තු ලෙස අයකර තිබුණි.

## 4.4 ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය

-----------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අංක C දරන ගොඩනැගිල්ලේ ස්ථාපිත වැසිකිළි 22 ක් අලුත්වැඩියා කිරීමේ උපදේශන හා ඉදිකිරීම් කාර්යය ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙත ප්‍රදානය කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කර තිබුණු නමුත් ඒ සඳහා ප්‍රසම්පාදන කමිටු අනුමැතිය ලබාගෙන නොතිබුණි. එම දෙපාර්තමේන්තුව විසින් පිළියෙලකර තිබුණු ඉංජිනේරු ඇස්තමේන්තුව රු.122,771,550 ක් වූ අතර වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ලෙස රු.8,000,000 ක් 2015 අගෝස්තු 12 දින එම දෙපාර්තමේන්තුව වෙත ගෙවා තිබුණි. 2016 මැයි 20 දින වන විටත් ඉදිකිරීම්වල ප්‍රමාණවත් කාර්යසාධනයක් ලබා නොතිබීම හේතුවෙන් එම කොන්ත්‍රාත්තුව රෝහල විසින් අවලංගුකර තිබුණි. එහෙත් ගොඩනැගිලි දෙපාර්තමේන්තුව එතෙක් ඉටුකළ වැඩ සඳහා බිල්පත් ලබාගැනීමට හා අත්තිකාරම් ලෙස ලබාදුන් මුදල් නිරවුල් කරගැනීමට 2017 ඔක්තෝබර් 31 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

(ආ) (i) හෘද රෝග අංශ ගොඩනැගිල්ලේ Aluminium Sun Shades සවිකිරීමේ කොන්ත්‍රාත්තුව සඳහා රු. 3,286,800 ක් වූ ඉංජිනේරු ඇස්තමේන්තුවෙන් සියයට 52 කට වඩා අඩුවෙන් රු.1,556,775 ක් වූ අවම ලංසු මිල, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.9.11 වගන්තිය පරිදි විස්තරාත්මක ඇගයීම් සිදුනොකර කොන්ත්‍රාත්කරුගේ අනුප්‍රමාණ (Rate) විශ්ලේෂණයක් ලබාගැනීමකින් තොරව හා අතිරේක කාර්යසාධන සුරක්ෂණයක් ලබාගැනීමකින් තොරව සුදුසුකම් ලැබූ කොන්ත්‍රාත්කරු ලෙස තෝරාගෙන තිබුණි.

(ii) දෙවන අවම මිල වූ රු.3,278,550 ක් ඉදිරිපත් කර තිබුණු සැපයුම්කරු වෙත කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමේ හැකියාව තිබියදී නැවත ලංසු කැඳවීමට තීරණය කර රු.3,385,800 ක අවම මිල ඉදිරිපත්කර තිබුණු කොන්ත්‍රාත්කරු වෙත කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබීම හේතුවෙන් රු.107,250 ක් මිල වැඩි වී තිබුණි.

(ඇ) කොන්ත්‍රාත් වටිනාකම රු.4,002,270 ක් වූ රෝහලේ අවිවාහක වෛද්‍ය නිල නිවාස කාමර බිත්ති ආලේප කිරීම සහ නාන කාමර හා සිවිලිම අලුත්වැඩියා කිරීමේ කොන්ත්‍රාත්තුව සඳහා රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.8 මාර්ගෝපදේශය ප්‍රකාරව කොන්ත්‍රාත් වටිනාකමින් සියයට 5 ක් ලෙස සහ කාර්යසාධන සුරක්ෂණයක් ලබානොගෙන කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි. ලංසු කොන්දේසි අංක 12 ප්‍රකාරව, 2015 දෙසැම්බර් 20 දින වන විට කොන්ත්‍රාත්තුව නිමකර භාරදිය යුතු වුවද 2016 මැයි 23 දින කොන්ත්‍රාත්තුවේ වැඩ අවසන් කර තිබුණ ද ප්‍රමාද ගාස්තු අයනොකර සම්පූර්ණ මුදල ගෙවා තිබුණි.

(ඈ) පැරණි ගොඩනැගිල්ලේ Hitachi චිලර් යන්ත්‍ර දෙකෙහි කොන්ත්‍රාත් වටිනාකම රු. 1,250,000 ක් වූ අළුත්වැඩියාව සඳහා, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1 වගන්තිය පරිදි ගිවිසුමකට එළැඹීමෙන් තොරව 2015 සැප්තැම්බර් 28 දින අළුත්වැඩියා කිරීම, පෞද්ගලික ආයතනයකට පවරා තිබුණි.

(ඉ) ප්‍රසම්පාදන සැලැස්මට අනුව, 2015 වර්ෂයේදී ආරම්භ කිරීමට සැලසුම්කර තිබුණු වැඩපොළ (Work Shop) ගොඩනැගිල්ල ඉදිකිරීමට අවශ්‍ය රු.මිලියන 80 ක ප්‍රතිපාදන 2016 වර්ෂයේදී සලසා ගෙන තිබුණි. එසේ වුවද ප්‍රසම්පාදන කටයුතුවල ප්‍රමාදය හේතුවෙන් කොන්ත්‍රාත්තුව පිරිනැමීමට 2016 නොවැම්බර් 09 දින දක්වා ප්‍රමාද වී තිබුණු අතර රු.මිලියන 96.5 කට එදින කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි. කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමේ ලිපිය ප්‍රකාරව, මෙම කොන්ත්‍රාත්තුව 2017 ජනවාරි 30 දින ආරම්භ කර 2018 අප්‍රේල් 29 දින වන විට අවසන් කළ යුතු වුවත් 2017 සැප්තැම්බර් 13 වන විටත් මූල්‍ය හා භෞතික කාර්ය සාධනය පිළිවෙලින් රු.27,131,481 ක් හා සියයට 10 ත් 12 ත් අතර පැවතුණි.

(ඊ) ප්‍රසම්පාදන සැලැස්මට අනුව, 2015 වර්ෂයේදී ආරම්භ කිරීමට සැලසුම්කර තිබුණු පිරිමි හෙද නේවාසිකාගාරය ඉදිකිරීමට අවශ්‍ය රු.මිලියන 100 ක ප්‍රතිපාදන 2016 වර්ෂයේදී සලසා ගෙන තිබුණි. එහෙත් ප්‍රසම්පාදන ක්‍රියාවලිය ආරම්භ කිරීම සඳහා 2016 සැප්තැම්බර් 09 දින දක්වාම කල් ගත කර තිබුණු අතර 2017 පෙබරවාරි 16 දින කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණද 2017 ඔක්තෝබර් 31 දින වන විටත් ගිවිසුම් අත්සන් කර නොතිබුණි. තවද වැඩ පූර්ව අත්තිකාරම් (Mobilization Advanced) ලෙස රු.12,945,941ක් ගෙවා තිබුණු මෙම ඉදිකිරීමේ කාර්යය 2018 ජුනි 27 දින වන විට නිම කළ යුතු වුවද 2017 දෙසැම්බර් 31 දින වන විටත් ගොඩනැගිල්ලෙහි අත්තිවාරම ඉදිකිරීම හෝ අවසන්කර නොතිබුණි.

## 4.5 හඳුනාගන්නා ලද පාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2012 වර්ෂයේදී රු.4,118,100 ක් වැයකර ස්නායු ශල්‍ය ඒකකයට මිලදී ගෙන තිබුණු ශල්‍ය ද්‍රව්‍ය ඒකක 159 ක් 2014 දෙසැම්බර් 31 දින කල් ඉකුත්වීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේදී අපහරණය කර තිබුණි. ඉකුත් වර්ෂවල පාරිභෝජන රටාව පිළිබඳ නිසි අධ්‍යයනයකින් හා අවශ්‍යතාවය හඳුනාගැනීමෙන් තොරව මෙම ද්‍රව්‍ය මිලදී ගැනීම පිළිබඳව අමාත්‍යාංශ මට්ටමින් පරීක්ෂණයක් සිදුකර වාර්තාවක් ඉදිරිපත් කරන ලෙසට පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් නියම කර තිබුණද එම පරීක්ෂණය පවත්වා නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගබඩා 5 ක, වාට්ටු 9 ක හා රෝහලේ වෙනත් අංශ 4 ක පැවති කල් ඉකුත්වී තිබුණු ඖෂධ හා ශල්‍ය ද්‍රව්‍ය තොගවල මුළු පිරිවැය රු.449,294 ක් වූ අතර 2017 ඔක්තෝබර් 31 දින වන විටත් ඒවා විධිමත් ලෙස විනාශකර පොත්වලින් ඉවත් කර නොතිබුණි.

(ඇ) අවශ්‍යතාව නිසි පරිදි හඳුනා නොගෙන විකිරණ අංශය සඳහා මිලදී ගෙන තිබුණු Micro Bar Enema Kit පැකට් 190 ක් 2016 දෙසැම්බර් 31 දින වන විට සෙමින් චලනය වන අයිතමයක් ලෙස විකිරණ අංශ ගබඩාවේ ඉතිරිව පැවතුණි. ඉන් පැකට් 140 ක් 2017 ජූලි වන විට කල් ඉකුත්වීමට නියමිතව තිබුණු අතර, ඉන් පැකට් 60 ක් ශ්‍රී ලංකා ජාතික රෝහල වෙත 2017 මාර්තු මාසයේදී පරිත්‍යාග කර තිබුණි. 2017 ඔක්තෝබර් 31 වන විට පිරිවැය රු.108,000 ක් වූ පැකට් 40 ක් කල් ඉකුත් වී තිබුණි.

## 4.6 කාර්ය මණ්ඩල පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2016 පෙබරවාරි 10 හා 2017 ජුනි 09 දින පැවති පොදු ව්‍යාපාර කාරක සභා රැස්වීම්වලදී, රෝහලේ අධ්‍යක්ෂ හා ප්‍රධාන ගණකාධිකාරී යන ප්‍රධාන තනතුරුවල පැවති පුරප්පාඩු ස්ථිර වශයෙන් පිරවීමට සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය සෘජුව මැදිහත් වී කටයුතු කළ යුතු බව නියෝග කර තිබුණද, 2017 දෙසැම්බර් 31 දින දක්වාම අධ්‍යක්ෂ හා ප්‍රධාන ගණකාධිකාරී තනතුරු සඳහා ස්ථිර නිලධාරීන් පත්කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුරේ වැඩ බැලීම සඳහා එතෙක් රෝහලේ සේවයෙහි නියුක්තව සිටි වෛද්‍ය නිලධාරිනියක 2013 ජූලි 08 දින සිට පත්කර තිබුණි. තනතුරට අදාළ බඳවාගැනීම් පරිපාටිය අනුව, පැවතිය යුතු වෛද්‍ය පරිපාලනය සම්බන්ධයෙන් වර්ෂ 7 ක පළපුරුද්ද, පිළිගත් පශ්චාත් උපාධියක් හා වයස අවුරුදු 45 ට අඩු නොවීම යන සුදුසුකම් එම තනතුර පිරිනමන අවස්ථාවේ එම නිලධාරිනිය විසින් සපුරා නොතිබුණි. තවද, ආයතන සංග්‍රහයේ II

පරිච්ඡේදයේ 13.4.1 වගන්තිය අනුව නියමිත සුදුසුකම් ලබාගැනීමේ විභාගයකින් හෝ කාර්යක්ෂමතා කඩඉමකින් සමත් නොවීම නිසා සිය නිත්‍ය තනතුරේ වැටුප් ලක්ෂ්‍යයක් පසු කිරීමට අසමත් වූ නිලධාරියෙකු ඉහළ තනතුරක වැඩ බැලීමට පත් නොකළ යුතු වුවද කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත් නොවීමෙන් වර්ෂ 12 ක් වැටුප් වර්ධක උපයා ගැනීමටද අපොහොසත්ව තිබියදී ඇයට එම පත්වීම ලබාදී තිබුණි. තවද, මෙම නිලධාරිනිය වෙත වැඩ බැලීමේ වැටුප් ගෙවිය හැකි විධිමත් පත්වීම් ලිපියක් නිකුත්කර නොතිබියදී 2013 ජුලි 08 දින සිට 2017 ජනවාරි 31 දක්වා කාලය තුළ වැඩ බැලීමේ වැටුප් ලෙස රු.1,827,893 ක් ගෙවා තිබුණි.

(ඇ) රෝහලේ අධ්‍යක්ෂ තනතුර සඳහා විධිමත් පත්වීම් ලිපියක් ලබා නොතිබුණු වෛද්‍ය නිලධාරියෙකු 2015 මාර්තු 04 දින සිට එම තනතුරේ වැඩ භාරගෙන තිබුණු අතර එතැන් සිට 2017 දෙසැම්බර් 31 දින දක්වාම රෝහලේ සියළු කළමනාකරණ මට්ටමේ තීන්දු තීරණ සඳහා දායක වී තිබුණි. විධිමත් පත්වීම් ලිපියක් නොතිබුණු නමුත් ඒ පිළිබඳව නොසළකා අධ්‍යක්ෂ තනතුරේ ආරම්භක වැටුප හා තනතුරට අදාළ අනෙකුත් සියළු දීමනා ගෙවීමට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාදී තිබුණු බැවින් ඉහත සඳහන් කාල පරිච්ඡේදය තුළදී එම නිලධාරියා වෙත ගෙවා තිබුණු වැටුප් හා දීමනා එකතුව රු.5,903,431 ක් විය. අධ්‍යක්ෂ තනතුර සඳහා වූ බඳවා ගැනීම් පරිපාටිය අනුව තිබිය යුතු, වෛද්‍ය පරිපාලනය සම්බන්ධයෙන් වර්ෂ 7 ක පළපුරුද්ද හා පිළිගත් පශ්චාත් උපාධියක් යන සුදුසුකම් එම තනතුරේ වැඩ භාර ගත් අවස්ථාවේදී සපුරා නොතිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

## 5.1 සංයුක්ත සැලැස්ම

වර්ෂ 05 ක කාලයක් සඳහා සංයුක්ත සැලැස්මක් පිළියෙල කර තිබුණද එම සංයුක්ත සැලැස්මට අනුව කටයුතු කර නොතිබුණු බවත් සංයුක්ත සැලැස්මට අනුගතව ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර නොතිබුණු බවත් පහත දැක්වෙන නිරීක්ෂණවලින් තහවුරු විය.

(අ) 2014 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා වූ කාලය සඳහා පිළියෙලකර තිබුණු සංයුක්ත සැලැස්ම 2016 වර්ෂය සඳහා යාවත්කාලීන කර නොතිබුණි.

(ආ) සංයුක්ත සැලැස්මට අනුව, 2015 හා 2016 වර්ෂවලදී ක්‍රියාත්මක කළයුතු වූ, වෛද්‍යවරුන් සඳහා භෝජන ශාලාවක් ස්ථාපිත කිරීම, හෘද රෝගීන් සඳහා උසස් ප්‍රමිතියකින් යුක්තව රසායනාගාරයක් ඉදිකිරීම හා ළදරු දැඩි සත්කාර ඒකකය වැඩි දියුණු කිරීම යන කාර්යයන් සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර නොතිබුණි.

(ඇ) සංයුක්ත සැලැස්මට ඇතුළත් කර නොතිබුණු මධ්‍යම වායුසමීකරණ පද්ධතිය නැවත සැකසීම, විදුලිය සැපයීමේ පද්ධතිය වැඩි දියුණු කිරීම හා මගී විදුලි සෝපාන මිලදී ගැනීම යන කාර්යයන් සංයුක්ත සැලැස්ම යාවත්කාලීන කිරීමකින් තොරව සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර ක්‍රියාත්මක කර තිබුණි.

## 5.2 ක්‍රියාකාරී සැලැස්ම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අරමුණුගත එක් එක් කාර්යයන්ට අදාළ ඇස්තමේන්තුගත පිරිවැය ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර නොතිබුණි.

(ආ) ක්‍රියාකාරී සැලැස්මට අනුව, අපේක්ෂිත ඉලක්ක හා අරමුණු ළඟා කර ගැනීමේ ප්‍රගතිය මෙන්ම අයවැය ඇස්තමේන්තුව අනුව ඒ සඳහා වැය කළ මුදල හඳුනාගත හැකිවන පරිදි කාර්තුමය වශයෙන් ප්‍රගති වාර්තා පිළියෙලකර ඒවායේ පිටපත් 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 4.2.6 වගන්තිය ප්‍රකාරව අදාළ අමාත්‍යාංශය හා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර මහාරෝගාශාලා මණ්ඩලයේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත දැක්වෙන පාලන ක්ෂේත්‍ර කෙරෙහි කළමනාකරණයේ විශේෂ අවධානය යොමු විය යුතුය.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
| --- | --- |
| (අ) ස්ථාවර වත්කම් පාලනය | (i) සියලුම ස්ථාවර වත්කම් භෞතිකව හඳුනාගෙන වටිනාකම් තක්සේරුකර ලේඛනගත කිරීමට කටයුතු කර නොතිබීම.<br>(ii) වර්ෂය තුළදී මිලදී ගනු ලැබූ ස්ථාවර වත්කම් ඇතුළත් පරිගණක මුද්‍රිත ලේඛනය තුළ ගොඩනැගිලි වැඩිදියුණු කිරීම සඳහා සමාලෝචිත වර්ෂය තුළදී වැය කරන ලද රු.39,157,304 ක් ඇතුළත් කර නොතිබීම. |
| (ආ) තොග පාලනය | ඖෂධ හා ශල්‍ය ද්‍රව්‍ය ගබඩා මෙන්ම අනෙකුත් උප ගබඩාවල තොග ලේඛන යාවත්කාලීනව පවත්වා නොතිබීම සහ තොග ලැබීම්, නිකුත්කිරීම් හා තොග ශේෂ නිවැරදිව ගිණුම්ගත කිරීමේ ක්‍රමවේදයක් පරිගණක පද්ධතියට හඳුන්වාදී නොතිබීම හේතුවෙන් රෝහලේ අංශ 5 ක පැවති ශල්‍ය ද්‍රව්‍ය වර්ග 350 ක පිරිවැය පරිගණක පද්ධතිය තුළ ඇතුළත්ව නොතිබීම, තොග භෞතික සත්‍යාපන වාර්තාවල සංඛ්‍යා පැන්සලෙන් සටහන් කර තිබීම හා ඒවායේ නිරවද්‍යතාවය සහතික කර නොතිබීම හා ප්‍රධාන ගබඩාභාර නිලධාරීන් එම ගබඩාවල තොග සත්‍යාපන වාර්තාවල සිය අත්සන යොදා නොතිබීම. |
| (ඇ) කාර්ය මණ්ඩල පරිපාලනය | බඳවා ගැනීම්, උසස් කිරීම්, ශ්‍රේණිගත කිරීම් හා වැටුප් පරිමාණ සම්බන්ධ විධිමත් බඳවා ගැනීමේ පරිපාටි පිළියෙල කර අනුමත කර ගැනීමට කටයුතු කර නොතිබීම. |
| (ඈ) කොන්ත්‍රාත් පරිපාලනය | කොන්ත්‍රාත් පරිපාලනය සම්බන්ධව නිරන්තර සුපරීක්ෂණය හා අධීක්ෂණය සිදු නොකිරීම. |
| (ඉ) මිලදී ගැනීම් පාලනය | අවශ්‍යතාවය හඳුනාගෙන මිලදී ගැනීම් සිදුනොකිරීම හා කොන්දේසි ප්‍රකාරව සැපයුම්කරුවන්ගේ සේවය ලබා ගැනීමට කටයුතු කර නොතිබීම. |
| (ඊ) පරිගණක ගිණුම්කරන පද්ධතිය | ජර්නල් සටහන් අංකය, සංලක්ෂ්‍ය හා විස්තර පද්ධතියේ සඳහන්කර නොතිබීම, ද්විත්ව සටහන පිළිබඳ විස්තර ලෙජර් ගිණුම්වල සඳහන් නොවීම. |